සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 12 | S | I |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020
## Second Term Test - Grade 13 - 2020

විභාග අංකය ............................. **සාමාන්‍ය පොදු පරීක්ෂණය** කාලය පැය දෙකයි

උපදෙස්

- ♦ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ♦ 1 සිට 50 තෙක් එක එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි (x) යොදා දක්වන්න.

(1). 2019.11.16 දින පවත්වන ලද ජනාධිපතිවරණයෙන් තෝරා පත්කර ගන්නා ලද්දේ ශ්‍රී ලංකාවේ කීවැනි විධායක ජනාධිපතිවරයා ද?
1. 4 2. 5 3. 6 4. 7 5. 8

(2). 2019 දකුණු ආසියාතික මලල ක්‍රීඩා තරගාවලිය පවත්වන ලද්දේ කුමන රටකදී ද?
1. ඉන්දියාව 2. නේපාලය 3. පකිස්ථානය 4. ඇෆ්ගනිස්තානය 5. ශ්‍රී ලංකාව

(3). දකුණු ආසියාතික මළල ක්‍රීඩා තරඟාවලියකදී ශ්‍රී ලංකාව ජයග්‍රහණය කරන ලද ප්‍රථම රන් පදක්කම හිරුණි විජේරත්න ක්‍රීඩිකාව තම ක්‍රීඩා ඉසව්වෙන් 2019 දෙසැම්බර් මසයේ දී ජයග්‍රහණය කලාය. ඇය එම ක්‍රීඩා තරඟාවලියේ දී තරඟ කළ ක්‍රීඩා ඉසව්ව කුමක්ද?
1. මීටර් 400 2. දුර පැනීම 3. හෙල්ල විසි කිරීම
4. මැරතන් 5. බර ඉසිලීම

(4). වසර 47 ක් තිස්සේ යුරෝපා සංගමයේ සාමාජිකත්වය දරණ ලද රටක් 2020 ජනවාරි මාසයේ දී එම සංගමයෙන් ඉවත් විය. එම රට කුමක්ද?
1. ප්‍රංශය 2. ජර්මනිය 3. ඉතාලිය 4. මහා බ්‍රිතාන්‍ය 5. ග්‍රීසිය

(5). චීනයේ ආරම්භ වී ලොව පුරා ව්‍යාප්ත වූ කෙරෝනා වෛරසයට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලබා දෙන ලද නිල නාමය කුමක්ද?
1. කොවිඩ් 19 2. සාර්ස් 20 3. කොරෝනා 19 4. ඉන්ෆ්ලුවොන්සා K 5. එච් 1 එන් 1

(6). චීනයේ සිටි ශ්‍රී ලාංකිකයින් පිරිසක් කොරෝනා වෛරස් තර්ජනය හේතුවෙන් ශ්‍රී ලංකාවට රැගෙන විත් නිරෝධායතන මධ්‍යස්ථානක සති දෙකක කාලයක් රඳවා තබා ගන්නා ලදි. එම නිරෝධායන මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශය කුමක්ද?
1. බදුල්ල 2. බණ්ඩාරවෙල 3. මුල්ලේරියාව 4. දියතලාව 5. ජයවර්ධනපුර

(7) වායු දූෂණය හේතුවෙන් 2019 දෙසැම්බර් මසයේ දී ඉන්දියාවේ එක්තරා නගරයක පාසල් දින කීපයක් වසා දමන ලද අතර එම වායු දූෂණයේ බලපෑම ශ්‍රී ලංකාව ද ලක් වූ බවට වාර්තා විය. එසේ වසා දමන ලද පාසල් පිහිටි නගරය කුමක්ද?
1. නව දිල්ලි 2. කල්කටාව 3. බොම්බාය 4. චෙන්නායි 5. මදුරාසි

(8). 2019 දකුණු ආසියානු ක්‍රීඩා තරගාවලියේ දී තමා සහභාගී වූ මීටර් 1500 හා මීටර් 5000 යන ඉසව් දෙකෙන්ම රන් පදක්කම් දිනා ගන්නා ලද ශ්‍රී ලංකා ක්‍රිඩිකාව කවුද?
1. චමරි අතපත්තු 2. නිලානී රත්නායක 3. සශිකලා සිරිවර්ධන 4. රංජනී රාජනායගම් 5. හසිනි පෙරේරා

(9). 2020 ජනවාරි මසයේ දී තම රටට බලපෑ දැඩි නියගය හේතුවෙන් ඇති වූ ජල හිඟයට තාවකාලික පිළියමක් ලෙස ඔටුවන් 10,000 ක් ඝාතනය කිරීමට කටයුතු කරන ලද රට කුමක්ද?

1. ඕස්ට්‍රේලියාව 2. නවසීලන්තය 3. චීනය 4. ජපානය 5. තායිලන්තය

(10). 2020 පෙබරවාරි මසයේ දී පවත්වන ලද ඔස්කාර් චිත්‍රපට සම්මාන උළලේ දී, ඉතිහාසයේ ප්‍රථම වතාවට ඉංග්‍රීසි භාෂාවෙන් නිෂ්පාදනය නොකළ චිත්‍රපටයට හිමි ඔස්කාර් සම්මානය දිනාගන්නා ලදි. එම චිත්‍රපටය අයත් රට කුමක් ද?

1. ජර්මනිය 2. ප්‍රංශය 3. චීනය 4. ජපානය 5. දකුණු කොරියාව

(11). අද දිනට සුමිත්ගේ වසය සිසිරගේ වයස මෙන් තුන් ගුණයකි. සිසිර රමේෂ්ට වඩා අවුරුදු 05 බාලය. තව අවුරුදු දෙකකට පසු රමේෂ්ගේ වසය අවුරුදු 15 නම් සුමිත්ගේ දැන් වයස අවුරුදු කීය ද?

1. 13 2. 17 3. 20 4. 24 5. 25

(12). TILE යන වචනය කණ්ණාඩියකින් පිළිඹිඹු වන ආකාරය දැක්වෙන්නේ කුමන පිළිතුරේ ද?



(13). A, B, C, D, E කොඩි කණු 5 එක පේළියට සිටුවිය හැකි එකිනෙකට වෙනස් ආකාර යන්න කීය ද?


1. 120 2. 100 3. 54 4. 24 5. 20

(14). ධන පූර්ණ සංඛ්‍යා දෙකක එකතුව 17 කි. එම පූර්ණ සංඛ්‍යා දෙකෙහි ගුණිතය විය නොහැක්කේ මින් කුමක්ද?

1. 52 2. 62 3. 66 4. 70 5. 72

(15). මෙම රූපයේ ඇති සමචතුරස්‍ර ගණන කීයද?

1. 34 2. 36 3. 38 4. 40 5. 42



- **16 හා 17 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.**

ළමයි 80 ක කණ්ඩායමකින් අ.පො.ස. (ස.පෙළ) විභාගයේ දී 58 දෙනෙක් ගණිතය විෂය ද 44 දෙනෙක් ඉංග්‍රිසි විෂය ද සමත් වූ අතර ළමයින්ගේ 35% ක් මෙම විෂය දෙකම සමත් වූහ.

(16). ගණිතය පමණක් සමත් වූ ළමයි ගණන කීයද?
1. 16 2. 20 3. 28 4. 30 5. 32

(17). මෙම විෂය දෙකම අසමත් සිසුන් ගණන කීය ද?
1. 6 2. 7 3. 8 4. 9 5. 10

- **18 හා 19 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.**

චතුස්තලාකාර ලී කුට්ටියක ශිර්ෂ දෙකකින් කුඩා චතුස්තලාකාර කොටස් දෙකක් කපා වෙන් කර ඇත.

(18). ඉතිරිවන ඝන වස්තුවේ දාර ගණන කීයද?


1. 9 2. 12 3. 15 4. 18 5. 20

(19). එම ඝන වස්තුවේ ශීර්ෂ ගණන කීයද?


1. 4 2. 6 3. 8 4. 10 5. 12

(20). රූපයේ පරිමිතිය සෙන්ටිමීටර් කීය ද?

1. 39 2. 45 3. 48 4. 56 5. 62




- **21 සහ 22 ප්‍රශ්න පහත තිත් රටාව මත පදනම් වේ.**




(21). ශිෂ්‍යයෙක් බොත්තම්වලින් සකස් කළ රටාවක අවස්ථා 4 ක් ඉහත දැක්වේ. මෙම රටාවේ 8 වෙනි අවස්ථාව සැකසීමට අවශ්‍ය බොත්තම් ගණන කීයද?

1. 24 2. 28 3. 32 4. 36 5. 40

(22). 9 වෙනි සහ 10 වෙනි අවස්ථා දෙකම සැකසීමට අවශ්‍ය මුළු බොත්තම් ගණන කීයද?

1. 60 2. 70 3. 80 4. 90 5. 100

(23). A, B ගේ මවය. C, B ගේ සහෝදරයාය. D, A ගේ සහෝදරයාය. C හා D අතර ඇති ඥාති සම්බන්ධය කුමක්ද?

1. D, C ගේ මුණුපුරාය. 2. C, D ගේ මුණුපුරාය. 3. D, C ගේ මාමාය.
4. D, C ගේ බෑණා ය. 5. D, C ගේ සහෝදරයාය.

- **24 - 26 දක්වා ප්‍රශ්න කොටු ජාලකය ඇසුරෙනි. සෑම පේලියකම, තීරයකම, විකර්ණයක ම සංඛ්‍යාවල එකතුව සමාන වන සේ 1 සිට 16 තෙක් සංඛ්‍යා යොදා ඇති මැජික් කොටුවෙහි සමහර සංඛ්‍යාව වෙනුවට ඉංග්‍රීසි අක්ෂර (A,B,C,D) යොදා ඇත.**

| | | | |
|---|---|---|---|
| 16 | 2 | A | 13 |
| 5 | B | 10 | 8 |
| C | 7 | 6 | 12 |
| 4 | 14 | 15 | D |

24). A අක්ෂරයෙන් දක්වෙන සංඛ්‍යාව කුමක්ද?

1. 1 2. 3 3. 9 4. 11 5. 14

(25). D අක්ෂරයෙන් දැක්වෙන සංඛ්‍යාව කුමක් ද?

1. 1 2. 3 3. 9 4. 11 5. 14

(26). B හා C හි එකතුව කීයද?

1. 12 2. 14 3. 15 4. 20 5. 25


(27). වෘත්තයක අරය 7 Cm කි. එමෙන්ම දෙගුණයක අරයක් සහිත වෘත්තාකාර කඩදාසියක වර්ගඵලය වර්ග සෙන්ටිමීටර් කීයද?


1. 77 2. 154 3. 231 4. 308 5. 616

(28). සමචතුරස්‍රයක දිග 50% කින් වැඩි වූ විට එහි වර්ගඵලය සහ මුල් සමචතුරස්‍රයේ වර්ගඵලය අතර අනුපාතය වන්නේ,

1. 3:1 2. 3:2 3. 9:4 4. 8:5 5. 10:9

(29). සමපාද ත්‍රිකෝණාකාර කඩදාසියක් පාදවල මධ්‍යලක්ෂ්‍ය යාකරන රේඛා, නැමුම් රේඛාවන පරිදි ත්‍රිකෝණ එක මත එක සමපාත කර B හැඩය ලබා ගෙන ඒ මත සිදුරු දෙකක් සාදා ඇත. එය දිග හැරිය විට ලැබෙන නිවැරදි පෙනුම තෝරන්න.







(30). පැත්තක දිග 6 cm ක් වූ සමචතුරස්‍රයක වර්ගඵලයට සමාන වර්ගඵලයක් ඇති, දිග හා පළල පූර්ණ සංඛ්‍යාත්මක අගයන් වූ සෘජුකෝණාස්‍රයක පරිමිතිය විය නොහැක්කේ මින් කවරක් ද?

1. $26\ cm$ 2. $30\ cm$ 3. $34\ cm$ 4. $40\ cm$ 5. $74\ cm$

(31) ශිෂ්‍යයෙක් ගිනිකූරුවලින් සමචතුරස්‍ර දෙකක් සාදා තිබූ ආකාරය මෙහි දැක්වේ. මේ ආකාරයට සමචතුරස්‍ර 10 ක් සැකසීමට අවශ්‍ය ගිනිකූරු ගණන කීයද?




1. 22 2. 30 3. 31
4. 34 5. 40

(32). පහත එක් එක් අංකය යටතේ වාක්‍ය තුන බැගින් ඇත. අවසාන වාක්‍යයෙන්, මුල් වාක්‍ය දෙකෙන් එළඹිය හැකි නිවැරදි නිගමනය දැක්වෙන්නේ කුමන අංකය යටතේ ද?

1. P හා Q රෝසමල්වලට කැමතියි. Q හා R නෙළුම්මල් වලට කැමතිය. එබැවින් P හා R නෙළුම්මල්වලට කැමතිය.
2. P හා Q ඥාතීන්ය. Q හා R ඥාතීන් ය. ඒ නිසා P හා R ඥාතීන් ය.
3. P, Q ගේ මවය. Q , R ගේ සහෝදරිය යි. එබැවින් P R ගේ සහෝදරියයි.
4. P , Q ට වඩා උසය. Q , R ට වඩා උසය. ඒ නිසා P ,R ට වඩා උසය.
5. P හා Q රූපවාහිනිය නැරඹීමට කැමතිය. Q හා R පොත් කියවීමට කැමතිය. ඒ නිසා P හා R පොත් කියවීමට කැමතිය.

- **33 - 34 ප්‍රශ්න තීර ප්‍රස්තාරය මත පදනම් වේ.**

30 න් ලකුණු ලබා දුන් ගණිතය, සහ විද්‍යාව ප්‍රශ්න පත්‍ර දෙකකට සිසුන් පස් දෙනෙකු ලබා ගත් ලකුණු ප්‍රස්තාරයෙන් දැක්වේ.




(33). ගණිතය විෂය සඳහා සිසුන් සියලු දෙනාම ලබාගත් ලකුණු අනුව ශිෂ්‍යයෙකු ලබා ගත් මධ්‍යන්‍ය ලකුණු කීය ද?


1. 12 2. 16 3. 18 4. 20 5. 24

(34). විද්‍යාව විෂයට 40% ක් ලකුණු ලබා ඇත්තේ කවුද?


1. සමන් 2. අජිත් 3. දුලානි 4. ජයලි 5. සඳුනි

(35). රූපයේ $a + b + c + d + e + f$ හි අගය කීය ද ?

1. $250^0$
2. $270^0$
3. $290^0$
4. $360^0$
5. $540^0$




- **36 හා 37 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.**




(36). ඝනකයක් කුඩා ඝනක 27 කට කපා ඇත. සෑම මුහුණුක ම රූපයේ දැක්වෙන පරිදි මතුපිට තීන්ත ආලෝප කර ඇත. එක් මුහුණක් පමණක් තීන්ත ආලේප වී ඇති ඝනක ගණන කීයද?

1. 4 2. 6 3. 8 4. 9 5. 10

(37). එක් මුහුණකවත් තීන්ත ආලේප වී නැති ඝනක ගණන කීය ද?

1. 4 2. 6 3. 8 4. 9 5. 10

- **38, 39, 40 ප්‍රශ්න පහත රූපය මත පදනම් වේ.**




සිසුන් 7 දෙනෙකු $(A, B, C, D, F, G)$ අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී විෂයන් 04 සමත් වීම පිළිබඳ තොරතුරු රූපයෙන් දැක්වේ. එහි විශාලම ත්‍රිකෝණයෙන් ජීව විද්‍යාව ද විශාලම ත්‍රිපීසියමෙන් රසායන විද්‍යාව ද සමචතුරස්‍රයෙන් භෞතික විද්‍යාව ද වෘත්තයෙන් සාමාන්‍ය පොදු පරීක්ෂණය ද නිරූපණය වේ.

(38). විෂය 4 ම සමත් වී ඇති ශිෂ්‍යයා කවුද?

1. A 2. C 3. D

4. E 5. F


(39). විෂය 3 ක් සමත්ව සාමාන්‍ය පොදු පරීක්ෂණය අසමත් ශිෂ්‍යයා කවුද?

1. A 2. C 3. D 4. E 5. F


(40). රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව පමණක් සමත් ශිෂ්‍යයා කවුද?

1. A 2. C 3. D 4. E 5. F

(41). රූපයේ දැක්වෙන, දිග හැර ඇති ඝනකට සමාන වනුයේ පහත දී ඇති කුමන ඝනකය ද?




- **අංක 42, 43 යන ප්‍රශ්න පහත දැක්වෙන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරෙන දත්ත මත පදනම් වේ. x නැමැති සමාගම් A, B, C, D, F, යන එක් එක් අංශයේ වැටුප් ගෙවීම සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණයෙහි ප්‍රතිශත ප්‍රස්තාරයට මගින් දක්වා ඇත. x සමාගම 2005 වර්ෂයේ වැටුප් ගෙවීම සඳහා වෙන් කරන ලද මුළු මුදල රු. 20,000,000 කි.**




(42) වර්ෂ 2005 දී, A සහ B අංශ සඳහා වෙන්කරන ලද මුදලෙහි සාමාන්‍ය කොපමණ ද?

1. රු. 12 000 000
2. රු. 15 000 000
3. රු. 35 000 000
4. රු. 4 000 000
5. රු. 5 000 000

(43). x සමාගම 2005 වැටුප් ගෙවීම සඳහා වෙන් කරන ලද වැඩිම මුදල සහ අඩුම මුදල අතර වෙනස කොපමණ ද?

1. 2 700 000
2. 4 400 000
3. 4 700 000
4. 5 400 000
5. 6 600 000

- **අංක 44 හා 45 යන එක් එක් ප්‍රශ්නයට කරුණු තුනක් සහ නිගමනයක් බැගින් අයත් වේ.**
  - **කරුණුවලින් ඕනෑම එකක් භාවිතා කර නිගමනයට එළඹිය හැකිනම් A තෝරන්න.**
  - **කරුණුවලින් I සහ II භාවිතා කර නිගමනයට එළඹිය හැකිනම් B තෝරන්න.**
  - **කරුණුවලින් I සහ III භාවිතා කරන නිගමනයට එළඹිය හැකිනම් C තෝරන්න.**
  - **කරුණු වලින් II සහ III භාවිතා කර නිගමනයට එළඹිය හැකි නම් D තෝරන්න.**
  - **කරුණුවලින් එකක් හෝ වැඩි ගණනක් හෝ භාවිතා කර නිගමනයට එළඹිය නොහැකි නම් E තෝරන්න.**

(44). නිගමනය - ප්‍රියංක සිතාරාට වඩා උස ය.

i. පියුමි, ප්‍රියංකාට වඩා උසය.
ii. සිතාරා පාරමීට වඩා උසය.
iii. පාරමී සයුරිට වඩා උසය.

1. A
2. B
3. C
4. D
5. E

(45). නිගමනය - 2018 එක්තරා පාසල අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් ප්‍රතිශතය 70% කි.

i. අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්ගේ 30% ක් දෙවන වර විභාගයට පෙනී සිට සමත්ව ඇත.

ii. මෙම පාසලෙන් අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් වූවන්ගෙන් 30% ක් විශ්ව විද්‍යාලයක ඇතුළත් වීමට වරම් ලබා ඇත.

iii. එම පාසලේ අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් 40% ක් ප්‍රථම වතාවට විභාගයට පෙනී සිට සමත්ව ඇත.

1. A 2. B 3. C 4. D 5. E

(46). සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් සහ රැකියාලාභියකු අතර සංවාදයක් අනුපිළිවෙළ රහිතව පහත දැක්වේ. වඩාත් තර්කානුකූලව අනුපිළිවෙළක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A. ඔබගේ වර්තමාන සේවා ස්ථානයේ ඔබගේ තනතුර මොකක් ද?
B. ප්‍රචාරක ආයතනයට ඔබ ලබාදෙන තොරතුරු මොනවාද?
C. ආයතනයේ නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධන කටයුතු හා ප්‍රචාරණ කටයුතු පැවරී තිබෙන්නේ මටයි.
D. අපේ නිෂ්පාදනවල ගුණාත්මකබව හා නිෂ්පාදන වර්ගවල විශේෂත්වය පිළිබඳව අප ඔවුන්ට පැහැදිලි කරනවා.
E. රූපවාහිනී සහ පුවත්පත් දැන්වීම් මගින් තමයි අපි ප්‍රචාරණ කටයුතු කරන්නේ.
F. නෑ අපි ඒ සඳහා වෙළඳ දැන්වීම් ප්‍රචාරණ ආයතනක සංයෝගය ලබා ගන්නවා.
G. මා දැනට අලෙවි කළමණාකරුවකු ලෙස සේවය කරනවා
H. ඔබ ආයතනයේ ප්‍රචාරණ කටයුතු කරන්නේ කොහොම ද?
I. රූපවාහිනී වෙළඳ දැන්වීම් ඔබම නිර්මාණය කරනවා ද?
J. ඔබගේ තනතුරට අදාළ කාර්යයක් මොනවාද?

1. ACGJHIEFDB 2. AGJCHEIFBD 3. GDAJBCFHEI

4. AJHIFDGCEB 5. AGJEHFIDBC

- **ප්‍රශ්න අංක 47 ට පහත ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

කාර්මික රටවල් විසින් කාබන්ඩයොක්සයිඩ් සහ වෙනත් හරිතාගාර වායු වැඩිපුර වායුගෝලයට මුදා හරිනු ලැබේ. එසේ වුවද නීති රීතිවලට යටත් වී තම කර්මාන්ත ක්ෂේත්‍රය පසුබෑමකට ලක් කර ගැනීමට ඒ රටවල් මැලිකමක් දක්වයි. ඇමරිකාව එක්සත් ජනපදය ගෝලීය උණුසුම ඉහළ දැමීමට දායක වන ප්‍රධාන රටක් වන අතර ගෝලීය සමුළුවලදී එළැඹෙන තීරණ සමඟ එකඟ වීමට එම රට විවිධ තර්ක විතර්ක ගෙන එයි.

(47). ඉහත ඡේදයෙන් විස්තර වන අදහසට වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
1. ලොව සියළු රටවල් විසින් හරිතාගාර වායුගෝලයට නිකුත් කරනු ලැබේ.
2. කාර්මික රටවල් නීතිරීති වලට අවනත නොවේ.
3. නීති රීති වලට අවනත වීමෙන් තම රටවල කර්මාන්ත ක්ෂේත්‍රය දුර්වල වන බව කාර්මික රටවල් විශ්වාස කරයි.
4. ගෝලීය උණුසුම පාලනය කිරීම සඳහා කාර්මික රටවල් තම කාර්මික නිෂ්පාදන සීමා කළ යුතුය.
5. ගෝලීය සමුළු වලදී ගනු ලබන තීරණ බලපාන්නේ දිළිඳු රටවලට පමණි.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

- **ප්‍රශ්න අංක 48 පහත ඡේදය ඇසුරින් පිළිතුර තෝරන්න.**

රටක ආර්ථිකයේ පැවැත්ම තීරණය වන්නේ එරට ශ්‍රම බලකාය සක්‍රියව ආර්ථිකයට දායක කර ගන්නා ආකාරය අනුව ය. දියුණු රටවල් තම රටේ ශ්‍රම බලකාය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ආර්ථිකයට දායක කර ගනිමින් සීඝ්‍රයෙන් ඉදිරියට යමින් සිටින අතර එය එම රටවල ආර්ථික දියුණුවට බලපෑ ප්‍රධාන සාධකයකි. දකුණු ආසියානු රටක් වන ශ්‍රී ලංකාවකට ශ්‍රම බලකාය නිවැරදි ආකාරයට ආර්ථිකට දායක කරගෙන නැත. තරුණ රැකියා වියුක්තිය ඉහළ අගයක පැවතීම මගින් මෙම කරුණය මනාව ඔප්පු වේ.

(48). ඉහත ඡේදයෙන් විස්තර වන අදහසය වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
1. ශ්‍රම බලකාය ආර්ථිකයට දායක කර ගැනීමෙන් රටක් සංවර්ධනය වේ.
2. ශ්‍රී ලංකාව වැනි රටවල් දියුණු රටවල් අනුගමනය කළ යුතු ය.
3. දකුණු ආසියානු රටවල් තම ශ්‍රම බලකාය ආර්ථිකයට දායක කර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් නොමැත.
4. දියුණු රටවල් ශ්‍රම බලකාය ආර්ථිකයට දායක කරගෙන ඇති ආකාරය අනුගමනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ රැකියා වියුක්තිය අඩු කර ගැනීම මෙන්ම ආර්ථික දියුණුව ද අත්කර ගත හැක.
5. ශ්‍රී ලංකාව වැනි දකුණු ආසියානු රටවල ආර්ථික දියුණුව පහළ මට්ටමක පැවතීමට හේතුව රැකියා වියුක්තියයි.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

- **අංක 49 සහ 50 ප්‍රශ්න පහත ඡේදනය මත පදනම් වේ.**

ලෝකය වාර්ෂිකව භාවිතා කරන විවිධ සම්පත් ප්‍රමාණය 1970 සිට මේ වන විට සිව් ගුණයකින් පමණ ඉහළ ගොස් ඇත. එහෙත් මේ කාලය තුළ ජනගහනය වර්ධනය වී ඇත්තේ දෙගුණයකින් පමණකි. භාවිතය සඳහා අවශ්‍ය සම්පත් මේ ආකාරයට අලුතෙන් උකහා ගැනීම සඳහා බලපාන කරුණු කීපයක් තිබේ. ඉන් පළමුවැන්න වන්නේ වර්ධනය සඳහා නොඉඳුල් සම්පත් අලුතින් ලබා ගැනීම සඳහා අප පුරුදු වී සිටීමය. පවත්නා සම්පත් වඩා හොඳින් භාවිතා කිරීම සම්බන්ධව ලෝකයේ ඇති අවධානය අඩු ය. දෙවැන්න වන්නේ අප තව දුරටත් නිවාස, යටිතල පහසුකම් හා බර යන්ත්‍ර තව දුරටත් අළුතින් ඉදි කිරීම ය. මේවා ලෝකයේ වැඩිවන ජනගහනයට අවශ්‍ය වෙයි. තෙවැනි හේතුව වන්නේ භාවිතය අවසානයේ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා ප්‍රමාණවත් ක්‍රමවේදයක් නොතිබීම හා නිෂ්පාදනවල සැකසුම දුර්වල වීම ය. මේ නිසා සිදුවන්නේ අලුත් අමුද්‍රව්‍යවලට ඇති ඉල්ලුම ඉහළ යාමය. ඒ සඳහා පරිසරයෙන් සම්පත් උකහා ගැනීම දිගින් දිගටම සිදුවේ.

(49). ඉහත ඡේදයෙන් ප්‍රකාශ වන ප්‍රධාන අදහස වන්නේ,
1. සම්පත් භාවිතයෙන් අවම කිරීමට ගතහැකි පියවර පිළිබඳව ය.
2. වැඩිවන ජනගහනයට සරිලන සම්පත් ප්‍රමාණයක් නොතිබීම පිළිබඳව ය.
3. ප්‍රතිචක්ක්‍රීකරණයෙහි ඇති වැදගත්කම පිළිබඳව ය.
4. මෙතෙක් භාවිතයට නොගන්නා ලද සම්පත් සඳහා ඇති ඉල්ලුම වැඩිවීමට බලපා ඇති හේතු පිළිබඳ ය.
5. සම්පත් අධි භාවිතය නිසා සිදුවිය හැකි අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව ය.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

(50). ඉහත ඡේදයෙන් ප්‍රකාශ නොවන අදහසක් වන්නේ,
1. පවත්නා සම්පත් වඩාත් ඵලදායීව භාවිතා කිරීමට අවධානය අඩුවීම නිසා නොඉඳුල් සම්පත්වලට ඇති ඉල්ලුම වැඩි වී ඇත.
2. ජනගහන වර්ධනය නිසා අළුතින් ඉදිකිරීම් කරන්නාට සිදුවේ.
3. ප්‍රතිචක්කරණ ක්‍රමවේදය ශක්තිමත් නොවීම නම සම්පත් සඳහා ඉල්ලුම වැඩිවීමට හේතු වී ඇත.
4. යටිතල පහසුකම් හා බර යන්ත්‍ර සූත්‍ර භාවිතය සහ ප්‍රතිචක්‍රිකරණය තුළින් නොඉඳුල් සම්පත් නිර්මාණය කර ගත හැක.
5. ජනගහන වර්ධනය වන වේගයට වඩා වැඩි වේගයකින් සම්පත් භාවිතය වැඩිවිමට සිදුවේ.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

**සාමාන්‍ය පොදු පරීක්ෂණය - 2020**

**பொதுச் சாதாரண பரீட்சை – 2020**

**දෙවන වාර පරීක්ෂණය -2019 இரண்டாந் தவணைப் பரீட்சை – 2020**

**13 ශ්‍රේණිය - தரம் 13**

**පිළිතුරු - விடைகள்**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 4 | (11) | 4 | (21) | 4 | (31) | 3 | (41) | 1 |
| (2) | 2 | (12) | 5 | (22) | 5 | (32) | 2 | (42) | 4 |
| (3) | 4 | (13) | 1 | (23) | 3 | (33) | 3 | (43) | 4 |
| (4) | 1 | (14) | 2 | (24) | 2 | (34) | 4 | (44) | 5 |
| (5) | 4 | (15) | 4 | (25) | 1 | (35) | 3 | (45) | 3 |
| (6) | 4 | (16) | 4 | (26) | 4 | (36) | 2 | (46) | 2 |
| (7) | 1 | (17) | 1 | (27) | 5 | (37) | 4 | (47) | 3 |
| (8) | 2 | (18) | 2 | (28) | 3 | (38) | 4 | (48) | 4 |
| (9) | 1 | (19) | 3 | (29) | 4 | (39) | 3 | (49) | 4 |
| (10) | 5 | (20) | 5 | (30) | 3 | (40) | 2 | (50) | 4 |